# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය / Date: 2025.04.10 පැය 1235
දුරකථන අංකය / Tel.NO: 011-2887973
මගේ අංකය / My NO: D/Media/Out/699 /2025
විද්‍යුත් ලිපිනය / E-Mails: dir.media@police.gov.lk


**අළුත් අවුරුදු සමයේ විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

2025 සිංහල හා දෙමළ අළුත් අවුරුද්ද උදාවත් සමඟ මහජනතාව වැඩි වශයෙන් ඒකරාශී වන අවුරුදු උත්සව, සංගීත සංදශර්න, සැණකෙළි ඇතුළු උත්සව වලදී මහජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය විසින් විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් හා රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලබයි.

උත්සව සමයේදී මහජනතාව විශාල වශයෙන් කොළඹ නගරය කේන්ද්‍ර කරගෙන වෙළඳසැල් වෙත පැමිණීම අපේක්ෂා කරන බැවින් කොටුව, පිටකොටුව (ගාලුමුවදොර), බොරැල්ල, කිරුළපන හා බම්බලපිටිය යන ප්‍රදේශ වලට මෙන්ම ආගමික ස්ථාන පිහිටි ප්‍රදේශ වලට පැමිණෙන මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් 6000 කට අධික ප්‍රමාණයක් යොදවා ඇත. එමෙන්ම එම ප්‍රදේශවල ඇතිවිය හැකි රථ වාහන තදබදය අවම කර ගැනීම සඳහාද විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක වේ.

දිවයින පුරා උත්සව සමයේ මහජනතාවගේ ආරක්ෂාව සහ රථ වාහන හැසිරවීම සඳහා පොලිස් නිලධාරීන් 35000 කට අධික සංඛ්‍යාවක් යෙදවීමට කටයුතු කරනු ලබයි. මෙම කාලසීමාව තුළදී රථ වාහන නිලධාරීන් ඇතුළු පොලිස් නිලධාරීන් වෙත අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**